DMC
SRI LANKA

## රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

# ප්‍රසම්පාදන දැන්වීමයි

ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි ආපද ප්‍රතිචාර දක්වීමේ කටයුතු සඳහා අවශ්‍ය පහත සඳහන් භාණ්ඩ හා උපකරණ සැපයීම සඳහා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ. ඒ අනුව, පහත සඳහන් භාණ්ඩ හා උපකරණ සඳහා අදාළ සැපයුම්කරුවන් හට තම අභිමතය පරිදි මුද්‍රා තැබූ මිල ගණන් ඉදිරිපත් කළ හැක.

| ප්‍රසම්පාදන අංකය | ප්‍රසම්පාදනය | අයිතමය | මිලදී ගැනීමට නියමිත ප්‍රමාණයන් |
|---|---|---|---|
| DMC/FIN/2021 (PROCU:05-I) | හදිසි ආපද ප්‍රතිචාර දක්වීමේ උපකරණ මිලදී ගැනීම (කාණ්ඩ I) | 1. Boat Engine (OBM) 25 HP | 40 |
| | | 2. Generator 2.5 KVA | 20 |
| | | 3. Rescue Tube | 100 |
| | | 4. Mega Phone H/H | 55 |
| | | 5. Gum Boot | 1140 |
| | | 6. Throw Bag | 1000 |
| | | 7. Search Light 10W - 15W | 300 |
| DMC/FIN/2021 (PROCU:05-II) | හදිසි ආපද ප්‍රතිචාර දක්වීමේ උපකරණ මිලදී ගැනීම (කාණ්ඩ II) | 1. Fire Broom (Fire Beater) | 1500 |
| | | 2. Concrete Cutter (Power Cutter) | 20 |
| | | 3. Chain Saw | 35 |
| | | 4. Tent (8 Man) | 30 |
| | | 5. Mammoty with Handle | 300 |
| | | 6. Axe with Handle | 300 |
| | | 7. Manna Kethi | 200 |
| | | 8. Rescue Rope (200m) | 17 |
| DMC/FIN/2021 (PROCU:07) | සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණු උපකරණ මිලදී ගැනීම. | 1. Water Pack (Camel Pack) | 60 |
| | | 2. Hand Gloves | 60 |
| | | 3. Wire Cutter | 60 |
| | | 4. Head Mount Torch | 60 |
| | | 5. Toggle Rope (200m) | 04 |
| | | 6. GPS Garmin Montana 600T Camo | 02 |
| | | 7. Rappelling Rope | 02 |
| | | 8. Full Body Harness | 02 |
| | | 9. Ascension (Right) | 01 |
| | | 10. Footape | 02 |
| | | 11. Standard Locking D Carabineer | 03 |
| | | 12. Figure 8 Climbing | 02 |
| | | 13. Advanced Light Rappel gloves | 03 |
| | | 14. Kong Robot Descender | 02 |
| | | 15. Spinal Boards | 02 |
| | | 16. Pulley Carrucola Bloccante Ultraleggera | 01 |
| | | 17. Air Pillow (With compressor) 3 Sizes | 03 |

2021 අප්‍රේල් මස 19 වන දින සිට 2021 මැයි මස 19 වන දින දක්වා වැඩ කරන ඕනෑම දිනක පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා, කොළඹ 07, විද්‍යා මාවතේ පිහිටි ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ, 3 වන මහලේ මුදල් අංශයෙන් ප්‍රසම්පාදන පත්‍රිකාව ආපසු නොගෙවන රු.1,000.00ක ගාස්තුවක් ගෙවීමෙන් පසු ලබාගත හැක.

ඒ අනුව, ඉහත සඳහන් ප්‍රසම්පාදන කාණ්ඩ 03 සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන පත්‍රිකා ඉදිරිපත් කළ යුතු අතර, එහිදී තම අභිමතය පරිදි අදාළ කාණ්ඩයේ එක් අයිතමයකට හෝ අයිතම සියල්ලටම මිල ගණන් ඉදිරිපත් කළ හැක. එලෙස ඉදිරිපත් කරනු ලබන මිල ගණන් වල මුළු වටිනාකම සඳහා 1% ක ලංසු සුරක්ෂණයක්ද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

තවද, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවල ලිපි කවරයේ ඉහළ වම් කෙළවර ලංසු ඉදිරිපත් කරන භාණ්ඩයේ නම හා ප්‍රසම්පාදන අංකය සඳහන් කර මුද්‍රා තබා (ආයතනයට ආවේනික වූ ස්ටිකරයක් හෝ ආයතනික රබර් මුද්‍රාව හෝ ලාකඩ මුද්‍රාව) සභාපති – දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන ඒකකය, මූල්‍ය අංශය, ආපද කළමනාකරණ මධ්‍යස්ථානය, විද්‍යා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ 3 වන මහලේ මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත බහාලීම 2021 මැයි මස 20 වන දින පෙ.ව 10.30ට හෝ ඊට ප්‍රථම සිදු කළ යුතු අතර , එම වේලාවෙන් පසුව ලැබෙන සියළුම ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු පත්‍රිකා භාරගන්නා අවසන් වෙලාව නිමාවත් සමගම ලංසු විවෘත කිරීම සිදු කරන බැවින්, එම අවස්ථාවට සහභාගී වීමට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට අවස්ථාව ලැබෙන අතර, ඒ සඳහා බලයලත් නියෝජිතයකු පැමිණෙන විට බලය පැවරීමේ ලිපියද රැගෙන පැමිණිය යුතුය. තවද, ප්‍රසම්පාදන ඇණවුම් ලබාදෙන අවස්ථාවේදී අවශ්‍ය භාණ්ඩ ප්‍රමාණයන් වෙනස් කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන බව කාරුණිකව දන්වා සිටිමි.


**සභාපති – දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, විද්‍යා මාවත, කොළඹ 07.**

**දු.අ. 011-3668096, 0112-136270.**